(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(4).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 169/'12

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය,— 2012 නොවැම්බර් මස 09 වැනි දින සිදු වූ බන්ධනාගාර කැරැල්ල සම්බන්ධයෙන් විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2012 නොවැම්බර් මස 09 වැනි දින රාත්‍රී කාලයෙහි මහා පරිමාණයේ බන්ධනාගාර කැරැල්ලක් හටගත් අතර 2012 නොවැම්බර් මස 10 වැනි දින අලුයම කාලය දක්වා පැවති එම කැරැල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන් 30 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් මරණයට පත්වී විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරී ලෙස කටයුතු කළ නියෝජ්‍ය පොලිස්පතිවරයාද ඇතුළුව, ඒ හා සමාන පුද්ගලයන් සංඛ්‍යාවකට තුවාල සිදුවී ඇති හෙයින්ද;

බන්ධනාගාර තුළ මෙවැනි ආකාරයේ සිදුවීම් ඇති වූ පළමුවතාව මෙය නොවන හෙයින්; සහ

බන්ධනාගාර පද්ධතිය තුළ ඇති දූෂණ ක්‍රියා හේතුකොට ගෙන මෙම සිදුවීම් ඇති වී තිබෙන බව පෙනී යන හෙයින් ද;

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි.

(අ) මෙවර ඇති වූ කැරැල්ලට ආසන්නම හේතුව කවරේද;

(ආ) බන්ධනාගාර තුළ නිතර කැරලි ඇති වීමට හේතු සාධකවන කරුණු කවරේද;

(ඇ) බන්ධනාගාර තුළ විනය පවත්වා ගෙනයාම කෙරෙහි බලපාන දිගුකාලීන ගැටලු කවරේද;

(ඈ) මෙවැනි සිදුවීම් වළක්වාලීම සඳහා ගත යුතු කෙටිකාලීන හා දිගුකාලීන පියවර කවරේද;

(ඉ) කාරක සභාව විසින් අදාළ වේ යැයි සිතිය හැකි වෙනත් කිසියම් කරුණු ඇතොත් එම කරුණු;

2. (අ) මෙම කාරක සභාව සහ එහි සභාපති, කථානායකවරයා විසින් නම් කළ යුතුය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එකී කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද, එම පුද්ගලයා සතුව තිබෙන හෝ එම පුද්ගලයා භාරයේ පවතින කිසියම් ලියවිල්ලක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචික පරීක්ෂණවලට භාජනය කිරීම මගින් සාක්ෂිවල සත්‍ය අසත්‍යභාවය පරීක්ෂා කිරීමට හෝ අන්‍යාකාරයකින් ඒවා තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරන ලද පුද්ගලයෙක් විසින් සිදු කරවන දිවුරුම්දීමක් හෝ ප්‍රතිඥා දීමක් මගින් සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාව තම පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාල සීමාවක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබා දෙන එවන් වෙනත් හෝ වැඩිදුර කාලසීමාවක් තුළ තම වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.